පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனதுஇலக்கம்<br>My No. LGD/2A/පොදු/I වෙළුම | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020.11.03 |

**ප්‍රමුඛ**

**චක්‍රලේඛ අංක : LGD/05/2020**

බස්නාහිර පළාතේ
සියලු ම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,

<u>පළාත් පාලන ආයතනවල සභා රැස්වීම් පැවැත්වීම</u>

මූලික නීතිය හා උපනීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පළාත් පාලන ආයතන විසින් සිය සාමාන්‍ය මහා සභා රැස්වීම් ලිත් මාසයක් අරමුණු කරගනිමින් පවත්වාලිය යුතු වේ. එමෙන් ම ඉහත කී ලිඛිත නීතිය යටතේ පිරිනමා ඇති බලතල යටතේ පළාත් පාලන ආයතන විසින් අවස්ථානුකූලව විශේෂ මහා සභා රැස්වීම් සඳහා ද නීතිමය විධිවිධාන සැලසී ඇත. එසේ ම අදාළ ලිඛිත නීතියෙහි සඳහන් වන්නා වූ සෙසු විධිවිධානයන් සපුරාලමින් එම සභා රැස්වීම් පැවැත්වීම එහි නීත්‍යානුකූලභාවය සඳහා වන නීතිමය අවශ්‍යතාවකි.

02. කෙසේ වුව ද නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනතට අනුව බස්නාහිර පළාත පුරා නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වන අවස්ථාවක ඉහත කී නීතිමය විධිවිධානයන්ට අනුකූලව පළාත් පාලන ආයතන විසින් සභා රැස්වීමක් පැවැත්විය නොහැකිය යන්න පිළිගත යුතු කරුණකි.

03. පවත්නා වසංගත තත්ත්වය තුළ බස්නාහිර පළාත පුරා නිරෝධායන විධිවිධාන ක්‍රියාත්මක වීමට අවකාශ සැලසීම පවත්නා තත්ත්වය යටතේ ප්‍රමුඛ අවශ්‍යතාව වශයෙන් සැලකිය යුතු වේ. එබැවින් නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ කටයුතු කරමින් පළාත් පාලන බලප්‍රදේශය තුළ ඊට අදාළ වගකීම් ක්‍රියාත්මක කිරීමට බලතල ඇති ගරු නගරාධිපති/ගරු සභාපති වශයෙන් එම ආඥා පනතේ හෝ ඒ යටතේ වූ රෙගුලාසිවල සඳහන් විධිවිධානයන්ට පටහැනි නොවන ආකාරයට සෑම පියවරක් ම ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.



| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|

| දුරකථන தொலைபேசி Telephone | පොදු General | කොමසාරිස් Commissioner | පාලන හා මානව සම්පත් Admin / HR | නීති Legal | සැලසුම් Planning | ගිණුම් Accounts | විමර්ශන Investigation | ආයතන පරිපාලන Establishment | ප්‍රජා සංවර්ධන Community Development |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ Email | lgd@wpc.gov.lk |
|---|---|---|---|---|---|

04. එහෙයින් පළාත් පාලන ආයතන සහා රැස්වීම් පැවැත්වීමෙහිලා කටයුතු කිරීමේ දී නිරෝධායන හා රෝග වැලැක්වීම් ආඥා පනතේ විධිවිධානයන්ට පටහැනි නොවන පරිදි බලප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විමසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු ආණ්ඩුකාරවර, බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 02. | ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 03. | ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 04. | පළාත් පාලන ලේකම්, බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 05. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 06. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බස්නාහිර පළාත | - | කා.දැ.ගැ.ස. |
| 07. | පළාත් පාලන සහකාර කොමසාරිස්, (කොළඹ/කළුතර/ගම්පහ) | - | කා.දැ.ගැ.ස. |